# 4. විද්‍යාව

ඇගයීම 01

01. පෘථිවියේ ජීවය සම්භවය ලබමින් පළමු සෛලය බිහි වූයේ මීට වසර කොපමණකට පෙරද?

02. මුලින්ම පෘථිවියේ සම්භවය වූයේ කිනම් ආකාරයේ ජීවීන් ද ?

03. වර්තමානයේ හමුවන අති විශාල විවිධත්වයක් සහිත ජීවීන් ඇතිවීමට හේතු වූ ක්‍රියවලිය කුමක් ද?

04. මෙතෙක් සොයාගෙන ඇති ජීවී විශේෂ සංඛ්‍යාව කොපමණ ද?

05. ජීවී වර්ගීකරණයක් අවශ්‍ය වන්නේ ඇයි?

06. ජීවී වර්ගීකරණය යන්න හඳුන්වන්න.

07. දැනට පිළිගන්නා නූතන ජීවී වර්ගීකරණය කුමක් ද?

ඇගයීම 02

01. ආකියා සහ බැක්ටීරියා අධිරාජධානි අතර ඇති

අ) සමානතාවයක්,

ආ) අසමානතාවයක් බැගින් ඉදිරිපත් කරන්න.

02. බැක්ටීරියා අධිරාජධානියට අයත් ජීවීන් වර්ග යුගළ සඳහන් නරන්න.

03 බැක්ටීරියා සහ ආකියා අධිරාජධානි වලින් ඉයුකැරියා අධිරාජධානිය වෙනස් වන ප්‍රධාන ලක්ෂණය කුමක් ද?

04. ඉයුකැරියා අධිරාජධානියට අයත් රාජධානි 4 නම් කරන්න.

05. ප්‍රොටිස්ටාවන් බහුලව ජීවත් වන පරිසර වල ඇති පොදු ගුණය කුමක් ද?

ඇගයීම 03

01. බහු සෛලික ශාක ඇතුළත් ජීවී කාණ්ඩය කුමක් ද?

02. ප්ලාන්ටේ රාජධානිය බෙදිය හැකි ඇාකාර දක්වන සටහනක් අඳින්න.

03. අපුෂ්ප ශාක සඳහා උදාහරණ 3ක් ලියන්න.

04. බීජ දරණ අපුෂ්ප ශෘක හඳුන්වන වෙනත් නමක් දී ඊට හේතුව ඉදිරිපත් කරන්න.

05. ඒකබීජපත්‍රී හා ද්විබීජපත්‍රී ශාක අතර මූල පද්ධතියේ ඇති වෙනස්කමක් ඉදිරිපත් කරන්න.

ඇගයීම 04

01. පහත සතුන් අයත් වන අපෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩය සඳහන් කරන්න.

* කැරපොත්තා
* පසගිල්ලා
* මුහුදු මල
* ගොළුබෙල්ලා
* ගැඩවිලා

02. එක් එක් අපෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩයට ආවේණික ලක්ෂණයක් බැගින් සඳහන් කරන්න.

ඇගයීම 05

01. පහත සඳහන් සතුන් අයත් වන පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩ සඳහන් කරන්න.

* හූනා
* ගිරවා
* ගෙම්බා
* මෝරා
* හාවා

02. Aves හා Mammalia අතර

අ) සමානකම්,

ආ) වෙනස්කම් 2 බැගින් සඳහන් කරන්න.

03. පහත ලක්ෂණ දරණ පෘෂ්ඨවංශි සත්ත්ව කාණ්ඩ නම් කරන්න.

1) ජලජ ජීවිතයට හොඳින්ම අනුවර්තනය වූ

2) පරිණාමිකව මුලින්ම ගොඩබිමට පැමිණි

3) හොඳින්ම ගොඩබිමට අනුවර්තනය වූ

4) වායව පරිසරය ජයගත්

5) ජලජ, භෞමික හා වායව පරිසර ජයගත්

04. ද්විපද නාමකරණයේ සම්මුතීන් ඉදිරිපත් කරන්න.